5. මුආමලාත්

5.1 සමාජය හා සම්බන්ධ ගණුදෙනු :-

- මුස්ලිම්වරයෙකු සෑම විටම හලාල් මාර්ගයේ උපයා ගත යුතු ය.
- අවංකව හවුල් ව්‍යාපාරයේ යෙදෙන කෙනෙකු අල්ලාහ්ගේ ආදරයට ලක්වේ.
- අවශ්‍යතා ඇති අයට ණය ලබා දීම හා නිසි කලට ණය පියවීම මුඃමින් වරයෙකුගේ යහගුණාංගයන්ගෙන් එකකි.
- ණය ලබා ගන්නා, තමන් ලබා ගන්නා ණයට ඇපයක් ලෙස යමක් තිබීම මගින් ණය දුන් පුද්ගලයාගේ යහපත ආරක්ෂා කළ කෙනෙක් වන්නේ ය.
- අවශ්‍ය වේලාවේ දී කුලියට ගැනීම හා දීම සඳහා ගිවිසුම් ඇතිකර ගැනීම ඉස්ලාම් අනුමත කරයි.
- අන් අයගේ සම්පත් අයථා ලෙස භුක්ති විඳින ක්‍රමය පොළිය වේ.
- පොළිය හා සම්බන්ධ වන පුද්ගලයා අල්ලාහ් සහ ඔහුගේ රසූල්වරයාගේ උපදෙස් ප්‍රතික්ෂේප කළ වරදට ලක්වේ.

දෛනික ජීවිතයේ මිනිසාට විවිධ අවශ්‍යතාවයන් ඇත. එයින් ප්‍රධාන ඒවා ලෙස ආහාර පාන, ඇඳුම් පැළඳුම්, නිවාස, වාහන හා පවුල යනාදිය සඳහන් කළ හැක. මෙය ලබාගැනීමට මිනිසා විවිධ ආකාරයෙන් උත්සාහ දරයි. මෙලෙස උත්සාහ දැරීමේ දී හලාල් වූ මාර්ගයෙන් ලබාගන්නා ලෙස ඉස්ලාම් උපදෙස් දෙයි.

" كَسْبُ الْحَلَالِ فَرِيْضَةٌ "

"හලාල් මාර්ගයෙන් ඉපයිම ෆර්ල් වේ" යන්න නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ වදනකි.

මෙලෙස හලාල් මාර්ගයෙන් උපයා ජීවත්වීම ගෞරවාන්විත වේ. යම් කෙනෙක් තවත් කෙනෙකුට අත පා ජීවත්වීම අගෞරවයක් වේ. පහත සඳහන් නබි වදන් මෙම අදහස තහවුරු කරයි.

" لَأَنْ يَأْخُذَ أَحَدُكُمْ حَبْلَهُ فَيَأْتِيْ بِحُزْمَةِ الْحَطَبِ فِيْ ظَهْرِهِ فَيَبِيْعَهَا فَيَكُفَّ اللهُ بِهَا وَجْهَهُ خَيْرٌ لَهُ مِنْ أَنْ يَّسْأَلَ النَّاسَ أَعْطَوْهُ أَوْ مَنَعُوْهُ "

"ඔබ අතරින් කෙනෙකු ලණුවක් රැගෙන කැළෑවකට ගොස් දරමිටි ඔසවාගෙන පැමිණ එය වෙළඳාම් කර ජීවත් වේ. මේ නිසා අල්ලාහ් ඔහුව අන් අය මත යැපී

ජීවත්වීමෙන් ආරක්ෂා කරයි. මිනිසුන් ඔහුට දුන්න ද, නොදුන්න ද මිනිසුන්ගෙන් අත පා ජීවත්වීමට වඩා මෙය උතුම් වේ.”

මේ නිසා අප උපයා ගන්නා මාර්ගය ඉස්ලාමීය සීමාවන් තුළ සකස් කර ගත්තේ නම් එය බරකත් සහිත වේ. තවද, ජීවිතයේ සැනසීම ද ඇති කරවයි. මෙපමණක් නොව මෙකී ඉපයීම ඉබාදතයක් වශයෙන් ද සැළකේ.

රැකියා අතරින් ශ්‍රේෂ්ඨ වන්නේ කෘෂිකර්මාන්තය යි. අනතුරුව වෙළඳාම ප්‍රධාන ස්ථානය ගනී. මෙය වංචාව, රැවටීම්වලින් තොරවුවක් විය යුතු බව අල්ලාහ් අල් කුර්ආනයේ අවධාරණය කරයි.”

" لَا تَأْكُلُوا أَمْوَالَكُمْ بَيْنَكُمْ بِالْبَاطِلِ "

ඔබගේ වස්තූන් ඔබ අතර අයථා ලෙස භාවිත නොකරන්න”.

(4:29)

මේ හේතුව මත පොළිය ගැනීම ද වංචා කිරීම ද, රැවටීම ද, අල්ලස් ගැනීම ද ඉස්ලාම් තහනම් කරයි.

වෙළෙඳාම වැනි මාර්ගයෙන් මිනිසා උපයා ගන්නා සේ ම, වෙනත් මාර්ගයෙන් ද ඔහුට සම්පත් ලැබේ. ඒවා නම්

1). වසියියත්

2). වරාසත්

3). වක්ෆ්

ඉහත සඳහන් මාතෘකා පිළිබඳව පසුව විස්තරාත්මකව දැන ගනිමු. පෙර ශ්‍රේණිවල ඉපයීමේ වැදගත්කම ගැන ඔබ දැනගත් අතර එසේ ඉපයීම සඳහා විවිධ ක්‍රමයන් ද තිබෙන බව දැන සිටින්නට ඇති. ඒවායෙන් හවුල් ව්‍යාපාරය, කුලියට දීම, උකස් යනාදිය සමහරක් වේ.

තවද කෙනෙකුගේ රැකියාව සඳහා ණය ද, වැදගත් ස්ථානයක් දරයි. බොහෝ විට මෙවැනි ණය ද පොළිය හා සම්බන්ධ එකක් වේ. මේ පිළිබඳව ද පසුව අවධාරණය කරමු.

හවුල් ව්‍යාපාරය

මිනිසා දැනුම, හැකියාව හා සම්පත් යනාදියෙන් එකිනෙකාට වෙනස් වේ. සිය දෛනික ජීවිතය සඳහා වු සෑම දෙයක් ම කෙනෙකුට ලබාගත නොහැකි ය. සමහරුන්ට අප්‍රමාණ සම්පත් තිබුණ ද එය වර්ධනය කිරීමට අවශ්‍ය දක්ෂතාවය තිබිය නොහැකි ය. තවත් සමහරුන්ගෙන් සම්පත් වර්ධනය කිරීමට අවශ්‍ය හැකියාව තිබුණ ද ඔහුගෙන් ඒ සඳහා වු ශාරීරික ශක්තිය හෝ අවශ්‍ය ප්‍රාග්ධනය තිබිය නොහැක.

හවුල් ව්‍යාපාරය යනු පිරිසකගේ සම්පත් ද, තවත් පිරිසකගේ හැකියාව ද, එකතුවී ආරම්භ වන රැකියා ක්‍රමයක් වේ.

මෙලෙස විවිධ අය අතර වෙන් ව ඇති සම්පත් හා හැකියාව එකතු වන විට ලාභය අත්කර දෙන සාමූහික උත්සාහයක් ඇති වේ. මෙමගින් එක්සත් භාවය ඇති වේ. සමාජයේ බොහෝ අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමට මග පාදයි. තවද හවුල් ව්‍යාපාරය මගින් ඉපයීම විශාල වර්ධනයක් ඇති වන්නකි. මේ පිළිබඳව අල්ලාහ් හදීස් කුද්සියේ මෙසේ අවධාරණය කරයි.

"أَنَا ثَالِثُ الشَّرِيْكَيْنِ مَا لَمْ يَخُنْ أَحَدُهُمَا"

"දෙදෙනෙකු හවුල් ව්‍යාපාරය කරන විට, දෙදෙනාගෙන් කෙනෙකු වංචා නොකරන තාක්, මම ඔවුනට උදව්වක් වශයෙන් සිටිමි."

(අබූදාවූද්)

මෙම හදීසය මගින් හවුල් ව්‍යාපාරයේ වැදගත්කම ගැන දැන ගත්තෙමු. හවුල් ව්‍යාපාරයේ යෙදෙනවිට පහත සඳහන් කොන්දේසි පිළිබඳව සැලකිලිමත් විය යුතු ය.

1). **ලාභය හා අලාභය ගිවිසුමේ සඳහන් කළ පරිදි බෙදී යා යුතුය.**
2). **වෙළෙඳ කටයුතුවලදී අන්‍යෝන්‍ය අවබෝධයකින් යුතුව ක්‍රියා කළ යුතුය.**
3). **හවුල් ව්‍යාපාරයේ කෙනෙක් හෝ සියලු දෙනාම සිය කොටසෙන් ඉවත් වුවහොත් හෝ කවුරුන් හෝ මරණයට පත්වුවොත් හවුල් ව්‍යාපාරය අවලංගු වේ.**

අභ්‍යාස

1. හවුල් ව්‍යාපාරය යනු කුමක් ද?
2. හවුල් ව්‍යාපාරයේ වැදගත්කම පිළිබඳව සඳහන් කරන්න.
3. හවුල් ව්‍යාපාරයේ කොන්දේසි ලැයිස්තු ගත කරන්න.
4. හවුල් ව්‍යාපාරයේ ප්‍රයෝජන කවරේ ද?
5. හවුල් ව්‍යාපාරය අවලංගුවීමේ හේතු සඳහන් කරන්න.
6. හවුල් ව්‍යාපාරය පිළිබඳ පවසන හදීසයක් ලියන්න.

I ණය

අපගේ අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමට සමහර අවස්ථාවල අන් අයගෙන් පිහිට පැතීමට සිදුවේ. භාණ්ඩමය වශයෙන් ද, මුදල්මය වශයෙන් ද, උපකාර ලබා ගන්නෙමු. මෙය ඉස්ලාම් අනුමත කළ එකක් වේ. අවශ්‍යතා ඇති වූ කෙනෙකුට ණය දීම දනයක් ලෙස සලකන බව ඉස්ලාම් පවසයි. මේ පිළිබඳව අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ.

" مَنْ ذَا الَّذِيْ يُقْرِضُ اللهَ قَرْضًا حَسَنًا فَيُضَاعِفَهُ لَهُ أَضْعَافًا كَثِيْرَةً "

"අල්ලාහ් උදෙසා අලංකාර ණය ලබාදෙන්නේ කවරෙක් ද? ඔහුට ඔහු ලබා දුන් ණයට වඩා කිහිප ගුණයකින් කුසල් ලබාදේ"

(20ඵ245)

මෙපමණක් නොව නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් ද, ණය ලබාගෙන ඇති බව ඉතිහාසය අවධාරණය කරයි.

ණය ලබාගන්නා සිය අවශ්‍යතාවයට මිස නිතරම ණය ලබා නොගත යුතුය යන්න ඉස්ලාමයේ උපදෙසකි. එලෙසම තමන් ලබා ගන්නා වූ ණය නැවත ගෙවීමේ චේතනාවෙන් ලබා ගත යුතු ය. යන්නෙන් ද ඉස්ලාම් බල කරයි.

යමෙකු මිය ගිය විට ඔහුගේ ජනාසාව සඳහා කළ යුතු යුතුකම්වලින් පළමුවැන්න ණය පියවීම වේ. ණයකාරයෙකු ලෙස මිය ගිය කෙනෙකුගේ ජනාසා සලාතය මෙහෙයවීමට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පසුබට වී ඇත.

වරක් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා වෙත එක් ජනාසාවක් ගෙන ආවේ ය. එවිට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ සලාතය මෙහෙයවීමට ඉදිරිපත් වූහ. එම අවස්ථාවේ එම ස්ථානයට එක් රැස්ව සිටි පිරිස බලා මොහු කා හට හෝ ණය දීමට තිබෙන්නේ ද? යැයි විමසූහ. එවිට කෙනෙක් ඔව්, මොහු මා හට ණය ගෙවිය යුතුයි. යන්නෙන් පැවසූවේ ය. එවිට නබි තුමාණෝ ඔබලාගේ ජනාසාව වෙනුවෙන් ඔබලාම සලාතය මෙහෙය වන්න යනුවෙන් පවසා පසුබට වූහ. එම අවස්ථාවේ දී පුද්ගලයෙකු ඉදිරියට පැමිණ තමා එම ණය පියවීමට භාරගන්නා බව පැවසූ පසු නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ සලාතය මෙහෙය වූහ.

මෙමගින් ණය, වගකීමක් සහිත එකක් බවත්, ඒ පිළිබඳව විමසීමට ලක්වන බවත් පැහැදිලි වේ.

ණය ලබාගන්නා හා ණය දෙන්නා යන දෙදෙනාට ම තිබිය යුතු කොන්දේසීන් ද ඇත.

ඒවා නම්,

1. ණය ලබාදෙන්නා හා ලබාගන්නා යන දෙදෙනාම වැඩිවියට පත් වූ සිහිබුද්ධිය යුක්ත කෙනෙක් විය යුතු ය.
2. ණය පිළිබඳව ගිවිසුම් ඇති කරගන්නා වේලාවේ දී ඒ සඳහා ඉස්ලාම් පවසා ඇති පොදු කොන්දේසීන් සැලකිල්ලට ගත යුතු ය.

   උදා: කොන්දේසි පැහැදිලි ව තිබීම.
3. ණය ලබා දීමේ දී සාක්ෂි තබාගත යුතු අතර හැකි නම් ලිඛිතව පැවතීම ද යහපත් වේ.
4. ණය ලබා දීමේ දී ඒ සඳහා කොන්දේසි පැනවිය නොහැකි ය.

ණය ලබාගත් තැනැත්තා තමාට වත්කම් තිබියදීත් නොපියවා සිටීම පාපයක් වේ. ඒ සඳහා දඬුවමට ලක් කිරීමට හා කොන් කිරීමට ඉස්ලාමයේ අනුමැතිය ඇත. මේ පිළිබඳව නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා මෙසේ පවසා ඇත.

" مَطْلُ الْغَنِيِّ ظُلْمٌ "

"හැකියාව තිබිය දීත් ණය නොපියවා සිටීම අසාධාරණයකි."

මෙලෙසම ණය ලබාගත් තැනැත්තා සාධාරණ හේතූන් මත නියමිත දිනයේ ගෙවීමට නොහැකි වූ විට ණය ලබා දුන් පුද්ගලයාව දැනුවත් කළ යුතු ය. ඔහු ද එය පිළිගෙන අවශ්‍ය කාලය ලබා දිය යුතු ය. යන්නෙන් අල්ලාහ් පවසයි.

" وَإِنْ كَانَ ذُو عُسْرَةٍ فَنَظِرَةٌ إِلَى مَيْسَرَةٍ "

ණය ලබාගත් තැනැත්තා එය පියවීමට නොහැකි වූ විට තමාට හැකියාව උදා වන තෙක් ඉඩ ලබා දිය යුතුයි. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ මෙසේ පැවසූහ.

" مَنْ يَسَّرَ عَلَى مُعْسِرٍ يَسَّرَهُ اللهُ فِي الدُّنْيَا وَالْآخِرَةِ "

"දුෂ්කරතා ඇති කෙනෙකුට යමෙක් උදව් කරන්නේ නම් ඔහුගේ මෙලොව හා පරලොව දුෂ්කර කටයුතු අල්ලාහ් පහසු කරයි."

අභ්‍යාස

1. ණය ලබා දෙන තැනැත්තාට ලැබෙන්නා වූ ප්‍රතිඵල පිළිබඳ පවසන අල්කුර්ආන් වාක්‍ය සඳහන් කරන්න.
2. ණය ලබාගත් තැනැත්තා එය පියවීමට නොහැකි වූවොත් කුමක් කළ යුතු ද?
3. ණය දුන් තැනැත්තා ගත් තැනැත්තා සමඟ විනීතව හැසිරිය යුතු බව පවසන හදීසය සඳහන් කරන්න.
4. ණය ලබා ගැනීම පුරුද්දක් ලෙස ඇති කරගැනීමෙන් ඇති වන්නා වූ හානිය පිළිබඳව විස්තර කරන්න.
5. ණය සම්බන්ධව අල්කුර්ආනයේ ඇති 2ඵ282 වචනයේ තේරුම ලියන්න.

II උකස

ගුරුවරයා සලාම් පවසමින් පංති කාමරයට පිවිසේ.

ගුරුතුමා : අස්සලාමු අලෛකුම්

ශිෂ්‍යයන් : වඅලෛකුමුස් සලාම්

ගුරුතුමා : ණය ලබාදීමේ වැදගත්කම පිළිබඳව කවුද දන්නේ?

ෆාරිස් : මම දන්නවා; ඒ පිළිබඳව පවසා ඇති හදීසයක් කියන්නද?

ගුරුතුමා : ඔව්. කියන්න.

ෆාරිස් : කෙනෙක් වරක් ණය දුනහොත්, දෙවරක් සදකා දීම හා සමාන වේ යනුවෙන් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා පවසා තිබෙනවා.

ගුරුතුමා : ණය ලබාගන්නා, ඒ සඳහා ඇපයක් වශයෙන් යම් දෙයක් තැබීම පිළිබඳව ඔබලා දන්නවා ද?

ශිෂ්‍යයන් : උකස් තැබීම යනුවෙන් අහලා තිබෙනවා. නමුත් ඒ පිළිබඳ විස්තර දන්නේ නැහැ.

ගුරුතුමා : ඔව්, යමෙක් ණය ලබා ගැනීමේ දී එම ණයට ඇපයක් වශයෙන් යම් දෙයක් තැබීම "උකස" ලෙස හඳුන්වනවා. මේ පිළිබඳව අල්කුර්ආන් මෙසේ පවසයි.

"وَإِنْ كُنْتُمْ عَلَى سَفَرٍ وَلَمْ تَجِدُوا كَاتِبًا فَرِهَانٌ مَقْبُوضَةٌ "

ඔබ ගමනෙහි යෙදී සිටින විට ණය පිළිබඳව සටහන් කරගැනීමට කිසිවෙක් නොමැති නම් ඔබ ලබා ගන්නා වූ උකස අනුමත කර ඇත.

(20 ඊ 283)

ශිෂ්‍යයන් : මෙය තවදුරටත් පැහැදිළි කරන්නේ නම් ප්‍රයෝජනවත් වේවි.

ගුරුතුමා : දරුවනි, සමහර අවස්ථාවලදී ඔබගේ දෙමව්පියන්ට විශාල මුදල් ප්‍රමාණයක් අවශ්‍ය වීමට පුළුවන. එවිට එම අවශ්‍යතාව සම්පූර්ණ කර ගැනීමට ණය ලබා ගත හැකිය. මෙම ණය ගෞරවාන්විත ලෙස ලබාගැනීමට කවුරුත් ප්‍රිය කරයි. මේ සඳහා ඔබගේ නිවසේ ඔප්පුව හෝ පියාගේ වාහන රැගෙන ණය ලබා දෙන්නා වෙත ගොස්

ඇපයක් වශයෙන් තබා කැමති ප්‍රමාණයක් මුදලක් ලබා ගත හැකිය. මෙසේ තමන් ලබාගන්නා වූ ණය සඳහා යම් වස්තුවක් තැබීම "උකස" ලෙස හැඳින්විය හැකියි.

නසීර් : ඔබ කියූ පරිදි එක් සිද්ධියක් මාගේ පියාට ද සිදු විය. මගේ මල්ලී වෛද්‍ය සැත්කමක් සඳහා රෝහලට ඇතුල් කළ විට ඒ සඳහා මුදල් ගෙවීමට පියාණන්ට නොහැකි විය. එවිට ඔහු අපගේ නිවසේ ඔප්පුව රැගෙන ගොස් මස්ජිදයේ ඇති බයිතුල් මාල් මූල්‍ය ආයතනයේ තබා ණය ලබාගත්තා. සති දෙක තුනකින් ගත් ණය පියවා එම ඔප්පුව හරවා ගත්තා.

ගුරුතුමා : ඔව්, මෙයයි උකස, මේ සඳහා මතු සඳහන් කොන්දේසීන් ද තිබිය යුතු යි.

1) උකස් ගිවිසුම හා ණය ගිවිසුම වෙන් වෙන් ව සිදුවිය යුතු ය.
2) උකස් තබන ලද භාණ්ඩය විකිණීමට හැකි එකක් විය යුතු ය.

ශිෂ්‍යයන් : උකස් තබන ලද භාණ්ඩය භාවිතා කළ හැකි ද?

ගුරුතුමා : බැහැ. එම භාණ්ඩය භාවිතා කිරීමට හෝ එයින් ලැබෙන්නා වූ ලාභය ලබා ගැනීමට අනුමැතිය නැහැ. නමුත් එය නඩත්තු කිරීමට වැය වන මුදල එහි අයිතිකරුවා දැරිය යුතුයි.

ශිෂ්‍යයන් : ණය ලබාගත් තැනැත්තා විසින් එය පියවීමට නොහැකි වූ විට උකස් ගත් පුද්ගලයා එම භාණ්ඩය තමන් අයිති කර ගත හැකි ද?

ගුරුතුමා : බැහැ. උකස් තැබූ භාණ්ඩය එහි අයිතිකරුවා විකුණා එම ණය මුදල් පියවිය යුතු යි.

ශිෂ්‍යයන් : අල්හම්දුලිල්ලාහ්, අද ඉතා වැදගත් කරුණු පිළිබඳව අප දැනගත්තා. ජසාකල්ලාහු හයිරා!

III කුලියට දීම හා කුලියට ගැනීම

මිනිසා, සිය දෛනික ජීවිතයේ අවශ්‍යතාවන් ලබා ගැනීම පිණිස අන් අයගේ පිහිට පැතීම සිදු කරයි. පොදුවේ වාහන, නිවාස හා වෙනත් උපකරණ නොමැති අය වෙනත් අයගෙන් එය ලබාගනිති. එසේ ලබාගන්නාවිට අතමාරුවට හෝ කුලියට ලබා ගනියි.

පොදුවේ කුලියට දීම හා ගැනීම පිළිබඳව සළකන විට එක් වස්තුවක ප්‍රයෝජනය ලබාගැනීම පිණිස ඒ සඳහා දෙන උපකාරය "කුලිය" ලෙස හැඳින් වේ. එලෙසම යම් කෙනෙකුගෙන් සේවයක් ලබා ගැනිම පිණිස ද ලබාදෙන උපකාරය ද කුලිය ලෙස හැඳින්විය හැක.

ෂුඅයිබ් නබි තුමා, තම වත්තේ කුලියට රැකියාවක් සඳහා මූසා අලෛහිස්සලාම් තුමා පත් කළේ ය.

ඉස්ලාම් අනුමත කර ඇති ඉපයීම් මාර්ගවලින් කුලියට දීම ද එකක් වේ. එය සාර්ථකව කිරීමට පහත සඳහන් කොන්දේසීන් අඩංගු වී තිබිය යුතු ය.

1). දෙදෙනා අතර නිසි ගිවිසුමක් ඇතිවිය යුතු ය.
2). දෙදෙනාම සිහිබුද්ධියෙන් යුත් වැඩිවියට පත් වූ අය වීම.
3). කුලියට දෙන භාණ්ඩ භාවිතයට සුදුසු තත්වයේ තිබිය යුතු ය.
4). කුලී ප්‍රමාණය හා නිශ්චිත කාල සීමාව පිළිබඳව දැන සිටිය යුතු ය.
5). ඉස්ලාමයේ තහනම් කර ඇති ක්‍රියාවන් සඳහා කුලියට නොදිය යුතු ය.

කුලියට ගැනීමේ දී එහි සුරක්ෂිත භාවය ආරක්ෂා වන අන්දමින් කටයුතු කළ යුතුය. නොසැලකිල්ලෙන් හා වගකීමෙන් තොරව සිටීමෙන් ඇතිවන්නා වු අලාභය සඳහා කුලියට ගන්නා වගකිව යුතු ය.

අභ්‍යාස

1. කුලියට දීම සහ කුලියට ගැනීම සඳහා ඇති කොන්දේසින් සඳහන් කරන්න.

IV පොලිය

මිනිසා සිය ආර්ථික අවශ්‍යතාවන් ඉටු කරගැනීමට අනුගමනය කරන්නාවූ තවත් මාර්ගයක් වන්නේ පොලියට මුදල් ලබාදීමයි. මෙය ඉස්ලාමයේ සම්පූර්ණයෙන් තහනම් කර ඇති ක්‍රමයකි. අන් අයගේ වස්තූන් අයථා ලෙස අනුභව කිරීමක් ලෙස මෙය සැලකේ. මේ පිළිබඳව අල්කුර්ආනයේ මෙසේ සඳහන් කර ඇත.

" يَا أَيُّهَا الَّذِينَ آمَنُوا لَا تَأْكُلُوا أَمْوَالَكُمْ بَيْنَكُمْ بِالْبَاطِلِ "

"විශ්වාසවන්තයාණෙනි, ඔබ අතරින් කෙනෙක් තව කෙනෙකුගේ වස්තූන් අයථා ලෙස භාවිතා නොකරන්න. (4:29)

පොලිය, ලබා ගැනීම නිසා අල්ලාහ්ගේ හා නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ කෝපය හා ශාපය අපට ලබාදේ. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් පොලියට ගන්නා හා පොලියට දෙන්නා හා එයට උපකාර කරන්නාට ශාප කර ඇත.

පොලී සම්බන්ධතාවය අත්නොහරින අය අල්ලාහ් සහ ඔහුගේ දූතයා සමග යුධ ප්‍රකාශ කළ කෙනෙකු වශයෙන් සළකනු ලබයි. අල්කුර්ආනයේ

" فَإِنْ لَمْ تَفْعَلُوا فَأْذَنُوا بِحَرْبٍ مِنَ اللهِ وَرَسُولِهِ "

"ඔබ පොලියෙන් නොමිදියහොත් අල්ලාහ් සමග හා ඔහුගේ දූතයා සමග යුධ ප්‍රකාශ කරන්න." (2:279)

මෙම වාක්‍ය පහළ කළ අවස්ථාවේ දී කුරෛෂිවරුන් අතර විවිධ ආකාර පොලී ක්‍රමයන් බහුලව දක්නට තිබුණි. ඒවායෙන් ණය ලබා දී වාරිකය අවසන් වූ විට නැවතත් පොලී ප්‍රතිශතය වැඩි කිරීම ප්‍රධාන ස්ථානය ගත්තේ ය.

අන් අයගේ වස්තූන් වැරදි ආකාරයෙන් ලබාගෙන කුස පුරවා ගැනීම කොපමණ දරුණු අසාධාරණයක් ද යන්න පිළිබඳව සිහිකල්පනාව ඇති අය දැනගනිති.

පොලිය හා සම්බන්ධ බොහෝ අය සිය වස්තූන් සියල්ල අහිමි කරගෙන වේදනා විඳින තත්වය අප සැම විට ම දකින්නෙමු.

නමුත්, පොලී රහිත ඉස්ලාමීය ආර්ථික ක්‍රමයේ "මුලාරබා", "මුරාබහා" වැනි ව්‍යාපාර ක්‍රම ආර්ථික සමබරතාවයට මග පාදයි. සමාජ විරෝධී ක්‍රියාවල්වලින් මිනිස් වර්ගය ආරක්ෂා කරනු ලබයි.

වර්තමානයේ විවිධ නම් වලින් පොලී ක්‍රමය හඳුන්වා දී ඇත. ඉස්ලාමීය ඉපයීම් ක්‍රමය නොදන්නා සමහරු පොලිය මගින් ලබාගන්නා වූ ආදයම, වෙළෙඳම මගින්

ලබාගන්නා වූ ලාභයට සම කරති. මෙය යුදෙව්වන්ගේ චින්තනයකි. " අලාභය විඳ දරා ගැනීමට හැකි වූ තැනැත්තා ලාභය සඳහාද අයිතිය ඇති තැනැත්තා" යන්න ඉස්ලාමීය චින්තනයයි.

අපි මේ වනතුරු වෙළඳාම හා පොලිය අතර ප්‍රධාන වෙනස්කම් පිළිබඳව දැනගත්තෙමු. මේ ආකාරයෙන්, පොලියේ විපාකයෙන් ආරක්‍ෂා වීමට අපි වගබලා ගනිමු.

අභ්‍යාස

1. උකස් තැබීමට ඉස්ලාමයේ අනුමැතිය තිබේ ද?
   ඒ සඳහා වූ කොන්දේසීන් කවරේ ද?

2. පොලිය ආර්ථිකයේ ඇති කරවන බලපෑම් කවරේ ද?

3. පොලියේ අනිසි විපාක පිළිබඳව පවසන අල්කුර්ආන් වැකි හා හදීසයක් සඳහන් කරන්න.

4. ඉස්ලාම් අනුමත කර ඇති ව්‍යාපාර ක්‍රමයන් සඳහන් කරන්න.

5. පොලිය සමාජයෙන් ඉවත් කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග මොනවා ද?

V වසියියත්

- මිනිසා සෑම විට ම දන පරිත්‍යාගවල යෙදිය යුතුයි. එයින් එක් කොටසක් වන්නේ සිය මරණය අභියස ව කරන වසියියතයයි.
- කෙනෙක් මිය යන විට ඔහුගේ අඹු දරුවන් දුගීන් ලෙස නොසිටීම පිණිස මියගිය පුද්ගලයාගේ බූදලය උරුමකරුවන් අතර බෙදා දෙනු ලැබේ.
- සෑමවිට ම ප්‍රයෝජනවත් වන්නේ සදකතුල් ජාරියා හෙවත් නිත්‍ය සදකාවයි.

යම් පුද්ගලයෙකු මිය ගිය පසු ඔහුගේ දේපළවලින් කොටසක් අන් අයට ලැබෙන මාර්ගවලින්, "වසියියත් " ද එකක් වේ. යම් භාණ්ඩයක් හෝ දේපළක් හෝ එහි ප්‍රයෝජනය සඳහා කෙනෙකු සිය ජීවිත කාලයෙන් අනතුරුව තවත් කෙනෙකුට උරුම කර දීම වසියියත් වේ. මෙය "අන්තිම කැමැත්ත" යනුවෙන් හඳුන්වනු ලැබේ. මෙලෙස කෙනෙකු සිය අවසාන මොහොතේ වසියියත් කරන විට 1/3 ක කොටසක් පමණක් වසියියත් කළ හැකි ය. මෙයට වැඩි වසියියත් කළ විට මෙම වසියියතය අනුමත කිරීම ද, ප්‍රතික්ෂේප කිරීම ද පසු උරුමකරුවන්ගේ අයිතියකි.

වරක් සඃද් ඉබ්නු අබීවක්කාස් රලියල්ලාහු අන්හු, වසියියත් කිරිමට ප්‍රිය කළ විට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ "1/3 ත් අධිකය. ඔබ ඔබගේ පරම්පරාව දුගීන් ලෙස හැරයාමට වඩා ඔබගේ දේපළ ඔවුනට හැරයාම යහපත් වේ." යනුවෙන් පැවසූහ.

වසියියත් කිරිමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතුය

(1). වසියියත් කරන්නා වැඩිවියට පත්, සිහිබුද්ධියෙන් පසුවන කෙනෙක් විය යුතුය.

(2). බල කිරීමෙන් තොරව සිය කැමැත්තෙන් වසියියත් කළ යුතු ය.

(3). ලිඛිතව හෝ පැහැදිලි වචනයෙන් වසියියත් සිදුවිය යුතු ය.

(4). වසියියත් වලංගු වන්නේ වසියියත් කරන්නා මිය යෑමෙන් අනතුරුවයි.

(5). වසියියත් කිරීමට ලක්වන්නා පසු උරුම කරුවන් නොවිය යුතුයි.

වසියියත් හි වැදගත්කම පිළිබඳව මුහම්මද් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් මෙසේ පවසා ඇත.

"මුස්ලිම්වරයෙක් වෙත වසියියත් කළ යුතු දෙයක් තිබී. ඔහු එම වසියියතය නොලියා රාත්‍රි දෙකක් ගත කිරීම නොකළ යුතු ය." යන්න නබි වදනකි.

වසියියත් කරන්නාගේ අයිතිවාසිකම්

(1). වසියියත් කරන්නා තමන් කළ වසියියත් වලින් මිදීමට අයිතියක් ඇත.
(2). වසියියත් කළ වස්තුව වෙනස් කිරීමට ද ඔහුට අයිතියක් ඇත.

මරණය අබියස සිටින කෙනෙකු සිය කුඩා දරුවන්ගේ යහපත උදෙසා හා තමන් මත ඇති ණය පියවීම සඳහා තවත් කෙනෙකු පත් කළ හැක. ඔහු "වසියියු " ලෙස හඳුන්වනු ලැබේ.

අභ්‍යාසය

(1). වසියියත් යනු කුමක් ද?
(2). වසියියත් සඳහා අවශ්‍ය කොන්දේසීන් සඳහන් කරන්න.
(3). "වසිය්යු" ලෙස හඳුන්වනු ලබන්නේ කවුරුන් ද?

VI වරාසත් (බූදලය)

යමෙකු ඉපදෙනවිට කිසිවක් රැගෙන පැමිණෙන්නේ නැත. මරණයට පත්වනවිට ද ඔහු කිසිවක් රැගෙන යන්නේ ද නැත. මිනිසා සිය ජීවිත කාලය තුළ විවිධ ක්‍රමවලින් වස්තූන් ලබාගනියි. ජීවත් වන කාලය තුළ එය බුක්ති විඳින අතර සිය වත්කමට අනුව පවුලේ අවශ්‍යතාවයන් ද සම්පූර්ණ කරයි. ඔහු මරණයට පත්වන විට ඔහුට හිමි සියලු ම සම්පත් අතහැර මිය යයි. මෙය වරාසත් නොහොත් බූදලය ලෙස හැඳින් වේ.

මෙම දේපළවලින් මියගිය පුද්ගලයාගේ ණය, වසියියත් යනාදිය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ඉතිරිව ඇති දේපළ නිසි ලෙස වාරිස් වරු අතර අල්කුර්ආනයේ සඳහන් ව ඇති පරිදි බෙදා දිය යුතු ය.

මෙම දේපළ බෙදා දීම පිළිබඳව අල්කුර්ආනය ද, හදීසය ද, පැහැදිලිව සඳහන් කර ඇත. මෙය ඉටු කිරීමට ප්‍රතික්ෂේප කරන්නා ඉස්ලාමීය නීතියෙන් පිට වූ කෙනෙක් ලෙස හැඳින්වේ. ඉස්ලාම් මෙම නීතියට වැදගත්කමක් ලබා දී ඇති ආකාරයෙන් ම එම දේපළ කෙසේ උරුම කරුවන් අතර බෙදා දිය යුතු යන්න ද පැහැදිලි කරයි.

මෙය ලබා ගැනීමට සුදුසුකම් ඇති කොටස් තුන වන්නේ

1. අස්හාබුල් ෆුරූල්
2. අසබා
3. අල් අර්හාම්

මෙලෙස මිය ගිය තැනැත්තාගේ දේපළ ඉහත සඳහන් අය හැර වෙනත් කෙනෙකුට යාම අසාධාරණයක් විය හැකි ය. මේ හේතුවෙන් කෙනෙක් මිය ගියවිට

ඔහුගේ දේපළ සම්බන්ධව හිමිකම් ලබන්නේ කවුරුන් ද? යන්න අල් කුර්ආනයේ ඉතා පැහැදිලිව සඳහන් කර ඇත. 4 : 11/12 වන අල් කුර්ආන් වාක්‍යයේ බූදල් හිමිකරුවන් හා ඔවුන්ට අයත් කොටස් පැහැදිලිව සඳහන් වී ඇත.
එය කෙටියෙන් මෙසේ දැක්විය හැකි ය.

(1) බූදල් හිමිවන පිරිමි පාර්ශ්වය

පුතා	පියා
සීයා	සහෝදරයින් (එක් කුස උපන්, පියාමගින්, මව මගින්)
පුතාගේ පුතා	සහෝදරයාගේ පුතා,
සැමියා	

(2) බූදල් හිමිවන ස්ත්‍රී පාර්ශවය

- ♦ දියණිය, මව, ආච්චි, පුතාගේ දියණිය, සහෝදරිය (එක් කුස උපන් පියා මගින්, මව මගින්) බිරිඳ
  මොවුන් හැර වෙනත් අය බූදලයකට හිමිකම් ලැබිය නොහැකි ය.
  බුදලය බෙදා දෙන අවස්ථාවේ දි ස්ත්‍රී හා පුරුෂ දෙපාර්ශවයම සිටී නම්, පහත සඳහන් ආකාරයට හිමිකම් ලබයි.
- ♦ පියා, පුතා, දියණිය, මව, සැමියා, බිරිඳ, යන අයගෙන් එක් අයෙකු, අන් අයට බෙදා දීමේ දී කොන්දේසි හා සීමාවන් ඇත.
  අල්ලාහ් විසින් මෙලෙස නියම කරන ලද බෙදා දීමේ ක්‍රමය වෙනස්කිරීමට කිසිවෙකුට අයිතියක් නැත. මෙසේ කොටස් හිමිකරුවන් කවුරුන් ද? යන්න නියම කිරීම මගින් පහත සඳහන් කරුණු ආරක්ෂා කරනු ලැබේ.
- ♦ කෙනෙකුගේ මරණයෙන් පසු ඔහුගේ බූදලයට හිමිකම් කියන ඔහුට සමීප වූ අයට ලැබීම.
- ♦ මරණයෙන් පසුව ද ඥාති සබඳතාවය මෙමගින් තහවුරු වීම.
- ♦ යම් කෙනෙක් මිය ගියද ඔහුගේ පරපුරට එක්තරා ආකාරයේ සහනයක් ලෙස බූදලය උපකාරි වේ.

කෙනෙක් මිය යාමෙන් පසුව ඔහු විසින් අතහැර ගිය දේපළ බෙදා දීමට පෙර පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

(1). මියගිය තැනැත්තාගේ ණය පියවීම.
(2). ඔහු විසින් ලබා දිය යුතු zසකාත්, භාරය යනාදිය තිබේ නම් එය ඉටු කිරීම.
(3). කෆන් කර මිහිදන් කිරීමට අවශ්‍ය වියදම වෙන් කර තිබීම.
(4). වසියියත් කර ඇත්නම් එම වසියියතය ඉටු කිරිම.

කෙනෙකුගේ මරණය පිළිබඳව තහවුරු වූ විට ඔහුගේ දේපළ ඉහත සඳහන් කොටස් හිමිකරුවන්ට ලබා දීමට පෙර පහත සඳහන් කොන්දේසි පිළිබඳව ද අවධානය යොමු කළ යුතුයි.

- ♦ කොටස් හිමිකරුවන් සියල්ලන් ම ජීවතුන් අතර සිටීම පිළිබඳව තහවුරු කිරීම.
- ♦ මිය ගිය තැනැත්තා හා බූදල් හිමිකරුවා යන දෙදෙනා අතර ඇති ඥාති සම්බන්ධතාවය තහවුරු කරගැනීම.

ඉහත සඳහන් කළ කරුණු තිබුණ ද, පහත සඳහන් හේතු මත කෙනෙක් ඔහුට හිමි කොටස් අහිමි කර ගනී.

- වහලෙක් වීම
- දේපළ හිමිකරුවන් ව බූදල් හිමිකරුවන් ඝාතනය කිරීම.
- දෙදෙනාම වෙනස් වූ ආගම්වල සිටීම.

උදා : මිය ගිය තැනැත්තා මුස්ලිම් වශයෙන් ද බූදල් හිමිකරුවා කාෆිර් ලෙස ද සිටීම.

මෙලෙස අප අපගේ ජීවිතයේ අල්ලාහ් විසින් පෙන්වා දී ඇති ආකාරයට කොටස් හිමිවන අයට නිසිලෙස බෙදා දීම සම්බන්ධව ඉතා අවධානයෙන් සිටිය යුතු ය.

එසේ කිරීම අල්ලාහ්ගේ ආගම ඉටුකිරීමක් වේ. මෙයට අදාළ කරුණු හැදෑරීම ද වැදගත් වේ. මේ පිළිබඳ නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ මෙසේ පැවසුහ.

" أَوَّلُ مَا يُنْسَى مِنَ الْعِلْمِ عِلْمُ الْفَرَائِض "

"දැනුමෙන් ප්‍රථමයෙන් ම අමතක කරනු ලබන්නේ ෆරාඉල් පිළිබඳ දැනුමයි" (බූදලය පිළිබඳ දැනුම)

අභ්‍යාස

(1). බූදලය බෙදා දීමෙන් ඇතිවන ප්‍රයෝජන සඳහන් කරන්න.
(2). බූදලය හිමි වීම වළක්වන කරුණක් සඳහන් කරන්න.
(3). මිය ගිය තැනැත්තාගේ දේපළ සම්බන්ධයෙන් සැලකිය යුතු වගකීම් කවරේ ද?
(4). දේපළ හිමිකම් ලබන ස්ත්‍රීන්ගේ සංඛ්‍යාව සඳහන් කරන්න.
(5). දේපළ හිමිකම් ලබන කොටස් තුනකට අයත් අය කවුරුන් ද?

VII වක්ෆ්

ගුරුතුමිය සලාම් කියා පංතියට පිවිසුණාය. සිසු දැරියෝ පිළිතුරු ලෙස සලාම් කියා ඉතා සතුටින් පිළිගනිති. ඉස්ලාම් ගුරුතුමියගේ පැමිණීම සිසුවියන්ට නව ජීවයක් ලබාදුනි. මක් නිසාද අද එම ප්‍රදේශයේ මස්ජිදයට, එක් ධනවතෙක් ඉඩමක් වක්ෆ් කිරීමේ උත්සවය අවසන් වීමෙන් මඳ වෙලාවකින් පසුව ඉස්ලාම් කාල පරිච්ඡේදය ආරම්භ වීමයි. මේ මගින් සිසුවියන් වක්ෆ් පිළිබඳව දැන ගැනීමට උනන්දුවෙන් සිටින බව ගුරුතුමිය දුටුවා ය.

ගුරුතුමිය : සිසු දැරියනි, අද ඔබ ඉතා සතුටින් සිටින්නේ මක් නිසා ද?

සිසුවියන් : අද අපේ ගමේ සිදු වූ සිදුවීමටත්, අද පාඩමටත් සම්බන්ධතාවයක් තිබීම නිසා.

ගුරුතුමිය : අද ඔබේ ගමේ සිටින එක් ධනවතෙක් අක්කර 05 ක පොල්වත්තක් මස්ජිදයට වක්ෆ් කර ඇත. දන වලින් ඉතා උතුම් දෙයක් ඔහු ඉටුකර ඇත. මරණයෙන් පසු කෙනෙකුට පින් ලබාදෙන කාර්යයන් අතුරින් මෙය ද එකක්.

එක් සිසුවියක් : මරණයෙන් පසු පින් ලබා දෙන වෙනත් කාර්යන් මොනවා ද?

ගුරුතුමිය : ඔව්, කෙනෙක් මිය ගිය පසු ඔහුට පින් අත්කර දෙන කරුණු 03 ක් තිබේනවා, මේ පිළිබඳව නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන්,

" إذَا مَاتَ ابْنُ آدَمَ إنْقَطَعَ عَمَلُهُ إلَّا مِنْ ثَلَاثٍ عِلْمٍ يُنْتَفَعُ بِهِ ،
أوْ وَلَدٍ صَالِحٍ يَدْعُو لَهُ ، أوْ صَدَقَةٍ جَارِيَةٍ "

" මිනිසා මිය ගිය විට ඔහුගේ සියලුම ක්‍රියාවන් සමග ඇති සබඳතා විසන්ධි වේ. නමුත් කරුණු තුනක කුසල් පමණක් ඔහු සමග සම්බන්ධ වෙමින් පවතී. ඒවා නම් ප්‍රයෝජනවත් අධ්‍යාපනය, තමන් වෙනුවෙන් ප්‍රාර්ථනා කරන දරුවන්, සහ ස්ථිර දනයයි.

සිසුවියක් : ස්ථිර දනය ලෙස සැලකෙන එම වස්තුව මියගිය තැනැත්තාගේ පවුලේ අයට බූදලය ලෙස ලබාගත හැකි ද?

ගුරුතුමිය : මස්ජිදයකට පාසලකට හෝ පොදු ප්‍රයෝජනයන් සඳහා පවරනු ලබන දේපල වක්ෆ් ලෙස හැඳින්වේ. මෙය කිසිවෙකුට විකිණීමට හෝ බූදලය ලෙස ලබා ගැනීමට නොහැකි ය. ඉස්ලාම් ඉතිහාසයේ ප්‍රථම වරට වක්ෆ් කළ ගෞරවය හිමි වන්නේ දෙවන කලීෆා වන උමර් රලියල්ලාහු අන්හු තුමාට යි. එතුමා තමාට ලැබුණු දේපළ වක්ෆ් කරන අවස්ථාවේ

කිසිවෙකුට එම දේපළ බූදලයක් ලෙස හිමිකම් කීමට හෝ විකුණුම් කළ නොහැකි ය. යන කොන්දේසින් මත වක්ෆ් කළේ ය. වර්තමානයේත් වක්ෆ් කිරීමේ දී මෙම ක්‍රමය අනුගමනය කරයි. මේ හේතුවෙන් ඔබ ඇසූ පරිදි වක්ෆ් කළ දේ මස්ජිදයට අයත් වුවක් වෙයි. වක්ෆ් කළ තැනැත්තාගේ පවුලේ අයට බූදලයක් ලෙස ලබා ගත නොහැකියි.

සිසුවියක් : ශ්‍රී ලංකාවේ වක්ෆ් සම්බන්ධයෙන් භාරව කටයුතු කරන දෙපාර්තමේන්තුව කුමක්දැයි කියා දෙන්නට පුළුවන් ද?

ගුරුතුමිය : මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන වක්ෆ් සංගමය, ලංකාවේ ඇති මස්ජිදයන්, අරාබි මද්රසා, මුස්ලිම් අනාථ නිවාස යනාදි වක්ෆ් සම්බන්ධ දේපළ ආරක්ෂා කරමින් (අවධානයෙන්) සිටිනවා.

සිසුවියක් : උමර් රලියල්ලාහු අන්හු තුමා පමණක් ද වක්ෆ් කර ඇත්තේ ?

ගුරුතුමිය : නැහැ. උස්මාන් රලියල්ලාහු අන්හු තුමා ද මදීනාවේ ඇති බිඃරු රූමා නැමැති ළිඳ මිල දී ගෙන පොදු ප්‍රයෝජනය සඳහා වක්ෆ් කළා. කාලිද් රලියල්ලාහු අන්හු තුමාද සිය අශ්වයන් යුධ අවශ්‍යතාවයන් සඳහා වක්ෆ් කරලා තිබෙනවා. අප රටේ බොහෝ මස්ජිදයන්, මද්රසා හා පාසල් ද නඩත්තු කරන්නේ මෙම වක්ෆ් දේපළ මගින් ය.

සිසුවියක් : අද අප හොඳ දැනුමක් ලබා ගත්තා. අල්ලාහ් උදෙසා කරනු ලබන්නා වූ එක් දනයක් ලෙස සළකනු ලබන වක්ෆ් මරණින් පසුව ද පින් අත් කර දෙන බව දැනගත්තා. සහභාවරුන්ගේ කාලයේ සිට අද වනතුරු පවතින මෙම වටිනා කාර්ය අප රටේ ද ව්‍යාප්ත වෙමින් පවතින බව දැන ගත්තා. අපගේ ගමේ ද වක්ෆ් කරන ධනවතුන් බිහි කළ අල්ලාහ්ටම සියලු ම ප්‍රශංසා හිමි වේ වාඊ. අල්හම්දුල්ලාහ් !

අභ්‍යාස

(1). වක්ෆ් යන්නෙන් පවසනු ලබන්නේ කුමන දන වර්ගය ද?
(2). ඉස්ලාමයේ ප්‍රථම වරට වක්ෆ් කළ සහාබිවරයා කවරෙක් ද?
(3). අපගේ වාහන වක්ෆ් කිරීමට හැකි ද?
(4). වක්ෆ් හි වැදගත්කම පිළිබඳව සඳහන් කරන්න.
(5). වක්ෆ් කළ තැනැත්තාට හිමි වන ආනිසංස කවරේ ද?